පාර්ලිමේන්තුවේ පුස්තකාලය
05 AUG 1994
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 13 දරන
# සෞඛ්‍ය සේවා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 අප්‍රේල් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 30 යි — තැපැල් ගාස්තුව : ශත 75 යි

1987 අංක 13 දරන සෞඛ්‍ය සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 10 වන දින.]

එල්. ඩී.—ඕ. 23/86

**සෞඛ්‍ය සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1987 අංක 13 දරන සෞඛ්‍ය සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** 1962 අංක 13 දරන පනතින් සංශෝධිත, සෞඛ්‍ය සේවා පනතේ 4 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— **219 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) "සෞඛ්‍ය සභාව" යනුවෙන් හඳුන්වනු ලබන උපදේශක සභාවක් තිබිය යුතු අතර, එය අධ්‍යක්ෂවරයාගෙන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් තිදෙනාගෙන් සහ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන්නා වූ ද, තිදෙනකු පිළිවෙලින්, දෙපාර්තමේන්තුවේ වෛද්‍ය, ශල්‍ය සහ ප්‍රසව විද්‍යා අංශවල නිලධරයන් සහ එක් අයකු දෙපාර්තමේන්තුවේ දන්ත වෛද්‍ය අංශයේ නිලධරයකු වන දන්ත වෛද්‍යවරයකු වූ ද, හත් දෙනකුට නොවැඩි වෛද්‍ය වෘත්තිකයන් ගෙන් සමන්විත විය යුතු ය.

මෙම උපවගන්තියෙහි "වෛද්‍ය වෘත්තික" සහ "දන්ත වෛද්‍ය" යන වචනවල පිළිවෙලින් වෛද්‍ය ආඥාපනතෙහි ඇති අර්ථය ම විය යුතු ය.

ඒ 094666—7,250 (87/01)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.